සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.**

01 අටවන පා සරඹය හඳුන්වන සරඹ නාමය වන්නේ,

(1) දැළ අඩිය (2) කරණම් අඩිය (3) පසු පෙර අඩිය (4) සිව් අඩිය

02 සිංහරාජ වන්නමේ බෙර පදය වන්නේ,

(1) දොම්කිට කිට දොම් (2) ජිං ගත ගො ගො
(3) කුද ගත ගත දොං (4) දොංදොංත තකු දොං

03 ගැට බෙරය වාදනය කරන සාමාජීය උත්සව අවස්ථාවක් වන්නේ,

(1) පිළි ගැනීමේ උත්සවය (2) හේවිසි වාදනය
(3) පිරිත් පිංකම් (4) තේවා වාදන

04 තත්, ජිත්, තොං, නං බෙර වාදනයේදී හඳුන්වනු ලබන්නේ,

(1) ගර්භාක්ෂර වශයෙනි. (2) බීජාක්ෂර වශයෙනි.
(3) සරඹ පද වශයෙනි. (4) බෙර පද වශයෙනි.

05 ජිං ගත ගො ගො යන බෙර පදය වාදනය කළ හැකි තාල රූපය වන්නේ මාත්‍රා

(1) 3+3 තාල රූපයයි. (2) 4+4 තාල රූපයයි.
(3) 2+3 තාල රූපයයි. (4) 2+2 තාල රූපයයි.

06 බලි ශාන්ති කර්මයේ දී භාවිත කරන ගායන විශේෂයකි,

(1) පන් කවි (2) කෝල්මුර කවි (3) කඩතුරා කවි (4) ප්‍රශස්ති කවි

07 සැළ ලිහිණි සන්දේශය ලියවී ඇති යුගය වන්නේ,

(1) දඹදෙණි යුගය (2) කුරුණෑගල යුගය (3) ගම්පළ යුගය (4) කෝට්ටේ යුගය

08 "ලෙලදුන් නව තඹ පලුවන් පාදේ" මෙම කවිය අයත් සන්දේශ කාව්‍ය වන්නේ,

(1) හංස සන්දේශය (2) සැවුල් සන්දේශය
(3) සැලලිහිණි සන්දේශය (4) පරවි සන්දේශය

09 තාල තැබීම හා ගායනය එකවිට ඇරඹීම හඳුන්වනු ලබන්නේ,

(1) අවග්‍රහ යනුවෙනි. (2) විෂමග්‍රහ යනුවෙනි.
(3) සමග්‍රහ යනුවෙනි. (4) නව ග්‍රහ යනුවෙනි.

10 දවුල අයත් වන්නේ,

(1) ආතත වර්ගයට ය. (2) විතතාතත වර්ගයට ය.

(3) ඝන භාණ්ඩ වර්ගයට ය. (4) විතත වර්ගයට ය.

11 බෝසතාණන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳ කියවෙන වන්නම වන්නේ,

(1) තුරඟා වන්නම (2) වෛරොඩි වන්නම

(3) හනුමා වන්නම (4) නෛයියඩි වන්නම

12 පහතරට බෙර ඇස සාදා ගැනීමට භාවිතා කරන හම් වර්ගය වන්නේ,

(1) හරක් හමයි. (2) එළු හමයි. (3) ගෝණ හමයි. (4) හරක් සිවියයි. (බොක්ක)

13 පහන් මඩුවේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලියක් වන්නේ,

(1) දාන පහයි. (2) පොත්කඩේ යක්කමයි.

(3) දේව කෝල පාඩුවයි. (4) කතා පහයි.

14 කොහොඹා කංකාරි කතා පුවතේ එන චරිතයක් නොවන්නේ,

(1) මලය රජු (2) කුවේනිය (3) පඬුවස් දෙව්රජු (4) සේරමාන් රජු

15 රංග උපකරණයක් ලෙස කුල්ලක් නිර්මාණය සඳහා භාවිතා කළ හැකි අමු ද්‍රව්‍යයක් වන්නේ,

(1) කෙසෙල් පතුරු (2) පට පතුරු (3) ගොක්කොළ (4) හබරල කොළ

16 සතර බීජාක්ෂර මුල්කරගත් වාද්‍ය අංගයක් වන්නේ,

(1) මගුල් බෙර (2) කොතල පදය (3) අංගුලියා පදය (4) ගොඩ සරඹ

17 "සැස්සේරුව" සෙල් ලිපිය අයත්වන යුගය වන්නේ,

(1) අනුරාධපුරය (2) පොලොන්නරු යුගය

(3) කෝට්ටේ යුගය (4) ගම්පොළ යුගය

18 "කොරවක් ගල" ලෙන් ලිපියට අනුව "ගෘහපති" යනුවෙන් දැක්වෙන්නේ,

(1) ගෘහ පුත්‍රයෙකි. (2) වීර සෙබලෙකි.

(3) සෙන්පතිවරයෙකි. (4) නැටුම් පරම්පරාවකි.

19 ගැට බෙරයෙහි දකුණු ඇසෙහි ආරක්ෂාව සඳහා භාවිත කරන කොටස හඳුන්වන්නේ,

(1) කැපුම් හමයි. (2) කන්වරයයි.

(3) සුරත් තට්ටුවයි. (4) වෙනිවර කැරැල්ලයි.

20 ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා දිනපතා කල යුතු කාර්යයක් නොවන්නේ,

(1) පිරිසිදු ජලය පානය කිරීම.

(2) පෝෂ්‍යදායි ආහාර ගැනීම.

(3) ව්‍යායාම් වල නිරත වීම.

(4) මේදය සහිත ආහාර වැඩිපුර ආහාරයට ගැනීම.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර, පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම ගැන සාකච්ඡා කිරීමේදී එහි මූලාශ්‍ර පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් ය.

(1) සෙල් ලිපි ඇතුළත් යුග හා සෙල් ලිපි කීපයක් සඳහන් කරන්න.

(2) නර්තන කලාව හා සම්බන්ධ සන්දේශ කාව්‍ය 03 ක් සඳහන් කරන්න.

(3) සන්දේශ කාව්‍ය අතරින් නළඟන රැඟුම් විස්තර දැක්වෙන සැළලිහිණි සන්දේශයේ කවියක් ලියන්න.

02 (1) ශෝකය නමැති ස්ථායි භාවය නිරූපණය වන අවස්ථා 03 ක් නම් කරන්න.

(2) එම ස්ථායි භාවය නිරූපණය කළ හැකි සිද්ධියක් කෙටියෙන් ගොඩ නගන්න.

(3) ශෝකය නමැති ස්ථායි භාවය උපදින රසය කුමක්ද?

03 (1) ගැට බෙරහෙයි ව්‍යුහය හා සැකැස්ම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

(2) ගැට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් 05 ක් නම් කරන්න.

(3) ගැට බෙරයෙන් වාදනය කරන බෙර සරඹ 02 ක් ලියන්න.

04 (1) මහ තනි තිතට අයත් වන්නමක කවියක් ප්‍රස්ථාර කරන්න.

(2) එම වන්නමේ අඩව්ව ලියන්න.

(3) මහ තනි තිතට අයත් ගැමි ගායනාවක් ප්‍රස්ථාර කරන්න.

05 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණය කරයි.

(1) ගැමි නැටුම් යන්න හඳුන්වන්න.

(2) ගැමි නැටුමේ සුවිශේෂ ලක්ෂණ 03 ක් ලියන්න.

(3) පන් නෙලීමේ කවියක් හා ගොයම් කැපීමේ කවියක් ලියන්න.

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 4 ) | 03. ( 1 ) | 04. ( 2 ) | 05. ( 1 ) | 06. ( 3 ) | 07. ( 4 ) | 08. ( 4 ) | 09. ( 3 ) | 10. ( 2 ) |
| 11. ( 1 ) | 12. ( 4 ) | 13. ( 2 ) | 14. ( 4 ) | 15. ( 2 ) | 16. ( 3 ) | 17. ( 1 ) | 18. ( 4 ) | 19. ( 3 ) | 20. ( 4 ) |

**II කොටස**

01 (1) (i) අනුරාධපුරය, පොලොන්නරුව
(ii) සැස්සේරුව, කොරවක්ගල, පාලමොට්ටායි, සෙල් ලිපි. (ල. 03)

(2) (i) තිසර සන්දේශය
(ii) සැළලිහිණි සන්දේශය
(iii) පරවි සන්දේශය (ල. 03)

(3) "විදෙන ලෙලෙන නරුබර පුළුලු කුල රැදී" යන කවිය. (ල. 04)

02 (1) (i) ප්‍රියයන් ගෙන් වෙන්වීම. (ii) විපතක් සිදු වීම.
(iii) ඇලුම් කල දෙයක් අහිමි වීම. (iv) වධ හිංසාවන්ට ලක්වීම. (ල. 03)

(2) සිද්ධියක් නිර්මාණය කර ඇත්නම් (ල. 04)

(3) කරුණා රසය (ල. 03)

03 (1) ගැට බෙරයෙහි ව්‍යුහය හා සැකැස්ම විස්තර කර ඇත්නම් (ල. 04)

(2) ගැට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් 05 ක් නම් කර ඇත්නම් (ල. 03)

(3) (i) තකට (ii) කදට
(iii) තකට කුදට ආදී වශයෙන් ලියා ඇත්නම් (ල. 03)

04 (1) සිංහරාජ වන්නමේ කවියක් ප්‍රස්ථාර කර ඇත්නම් (ල. 04)

(2) "තාම් දොමිති ගත ...... " ලියා ඇත්නම් (ල. 03)

(3) මහ තනි තිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කර ඇත්නම් (ල. 03)

05 (1) ගැමි නැටුම් හඳුන්වා දී ඇත්නම් (ල. 03)

(2) සරල බව, සාමූහික බව, උපකරණ භාවිතය, සරල නාද මාලා කවි භාවිතය, සරල ඇඳුම් පැලඳුම් ආදිය කරුණු ලියා ඇත්නම්. (ල. 03)

(3) පන් නෙලීමේ කවියට (ල. 02) ගොයම් කවියට (ල. 02)